# නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## නැගෙනහිර පළාතේ සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගණිතය හා විද්‍යාව ගුරු පුරප්පාඩු සඳහා විශ්‍රාමික ගුරු භවතුන් (සිංහල මාධ්‍ය) කොන්ත්‍රාත් පදනමින් සේවයේ යොදවා ගැනීමට දීප ව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් කැඳවීම

නැගෙනහිර පළාතේ සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා විශ්‍රාමික ගුරු භවතුන් (සිංහල මාධ්‍ය) කොන්ත්‍රාත් පදනමින් සේවයේ යොදවා ගැනීමට දීප ව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2021.04.30 දින වේ. පවතින පුරප්පාඩු පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| අනු අංකය | අධ්‍යාපන කලාපය | පුරප්පාඩු ගණන | |
|---|---|---|---|
| | | ගණිතය | විද්‍යාව |
| 1 | අම්පාර | 33 | 16 |
| 2 | මහඔය | 11 | 04 |
| 3 | දෙහිඅත්තකණ්ඩිය | 17 | 07 |
| 4 | ත්‍රිකුණාමලය | 07 | 06 |
| 5 | ත්‍රිකුණාමලය උතුර | 16 | 14 |
| 6 | මූතූර් | 01 | - |
| 7 | කන්තලේ | 17 | 16 |

## 1. බඳවා ගැනීමේ ක්‍රමය

මෙම අයදුම්පත් කැඳවීමට අනුව අයදුම්පත් යොමු කරන අයදුම්කරුවන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය සහ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් ගේ නිර්දේශය මත විශ්‍රාමිකයින් නැවත සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 ද 2019.10.10 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2019 ද 2019.11.19 දිනැති නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ PPSC/2019/05 ද අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. බඳවා ගනු ලබන කාලය මාස 12ක උපරිමයකට හෝ තනතුරු පුරප්පාඩුව සඳහා ස්ථිර නිලධාරියකු පත්කරන තෙක් යන දිනයන් අතරින් පළමුව එළඹෙන දිනය දක්වා වේ.

## 2. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි 3 වන වගන්තිය අනුව වැටුප තීරණය කරනු ලැබේ.

## 3. කායික සුදුසුකම්

මෙම පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයකින් යුතු බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකුගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

## 4. අයදුම් කිරීමේ ක්‍රමය

**4.1.** මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 (සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.0 දක්වා පළමු පිටුවටද, අංක 6.0 සිට 8.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

**4.2.** **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක. එසේම අයදුම්කරුවන් තම සුදුසුකම් සනාථ කිරීමට අදාල සියලු සහතිකවල ඡායා පිටපත් අයදුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය.

**4.3.** අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන අයදුම්කරු අවසන් වරට සේවයේ යෙදී සිටි විදුහලේ විදුහල්පතිවරයා විසින් සහතික කළ යුතු අතර අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු නිවැරදි බවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා විසින් සහතික කර තිබිය යුතුය.

**4.4.** නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2021.04.30** වන දිනට හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලෙන් එවන ලද අයදුම්පත් නැතිවුවහොත් ඒ පිළිබඳ වගකීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ. **(අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)**

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
අංකඃ 198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය

**4.5.** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **AD/E10/TEA/2020/03/Rec** ලෙස සඳහන් කළ යුතුය.

**5.** සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**6.** තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**7.** මෙම දැන්වීමෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම සම්මුඛ පරීක්ෂණය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරු පුරප්පාඩුව පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලයද නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමිය සතු වේ.

එම්.වයි.සලීම්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.
07.04.2021

**AD/E10/TEA/2020/03/Rec**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාතේ සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගණිතය හා විද්‍යාව ගුරු පුරප්පාඩු සඳහා විශ්‍රාමික ගුරු භවතුන් (සිංහල මාධ්‍ය) කොන්ත්‍රාත් පදනමින් සේවයේ යොදවා ගැනීමට දීප ව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් කැඳවීම**

අයදුම් කරනු ලබන අධ්‍යාපන කලාපය : ……………………………

අයදුම් කරනු ලබන විෂයය : …………………………….

**1.0** 1.1 මුලකුරු සමග නම : Rev/Mr/Mrs/Miss ……………………………………………………………

*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : Mr. PERERA, A.B.C.)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ……………………………………………………………

1.3 සම්පූර්ණ නම : ……………………………………………………………
*(සිංහලෙන් )* ……………………………………………………………

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M ☐
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ……………………………………………………………

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ……………………………………………………………

2.2 ස්ථිර ලිපිනය : ……………………………………………………………
*(සිංහලෙන්/දෙමළෙන්)* ……………………………………………………………

2.3 සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපි එවිය යුතු ලිපිනය: ……………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ……………………………………………………………

**3.0** 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 **2021.04.30** දිනට වයස : වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

**4.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :……………………………………………………………………………..

**5.0** විශ්‍රාම ලැබූ දිනය වන විට රාජ්‍ය සේවයේ/පළාත් සේවයේ දරණ ලද තනතුර පිළිබඳ විස්තර ඃ-

5.1 සේවය කළ විදුහල/කාර්යාලය : ..........................................................................

5.2 දරණ ලද තනතුර : ..........................................................................

5.3 ශ්‍රේණිය : ..........................................................................

5.4 එම ශ්‍රේණියට පත්වූ දිනය : ..........................................................................

5.5 විශ්‍රාම ගත් දිනය : ..........................................................................

5.6 විශ්‍රාම ගැන්වීමට අදාල විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ වගන්තිය : ..........................................................................

## 6.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම පත්වීම අවලංගු කිරීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : …………………..……                                        ..………………………
                                                                අයදුම්කරුගේ අත්සන

## 7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම *(මෙම දැන්වීමෙහි 4.3 අනුව)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ………………………………..……………….මයා/මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මෙම විදුහලේ ………………………………. විෂයය පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් සේවයේ නියුක්තව සිටි බව ද, ඔහු මා ඉදිරිපිට දී ……………...………… දින ඔහුගේ අත්සන තැබූ බවද සහතික කරමි.

……………………………………..
විදුහල්පතිවරයාගේ අත්සන

දිනය : …………………..……
සහතික කරන්නාගේ නම : …………………..……
තනතුර : …………………..……
ලිපිනය : …………………..……
*(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)*

## 8.0 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාගේ සහතිකය

මෙම අයදුම්කරු වන…………………………………………… මහතා/මහත්මිය ශ්‍රී ලංකා ගුරු සේවයේ ………………………………. ශ්‍රේණියේ ගුරුවරයෙකු වශයෙන් මෙම අධ්‍යාපන කලාපයේ ………………………………. විදුහලේ ………………………………. විෂයය පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් සේවයේ නියුක්තව සිටි බව ද, ඔහු/ඇය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ …………..……….වගන්තිය අනුව…………..………. දින සේවයෙන් විශ්‍රාම ගෙන ඇති බවද ඔහු/ඇය සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියා මාර්ග ගෙන නොමැති බවද විශ්‍රාම ගැනීමට පෙර සේවා කාලය සතුටුදායක බවද ඔහු/ඇය ඉහතින් සපයා ඇති තොරතුරු නිවැරදි බවද මම සහතික කරමි.

දිනය : …………………..……                    ........................................................................
සහතික කරන්නාගේ නම : …………………..…...       කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අත්සන
තනතුර : …………………..……
ලිපිනය : …………………..……
*(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)*